# මඩුවන්වෙල වලව්ව ආශ්‍රිත වාස්තුවිද්‍යාත්මක විමර්ශනයක්

එස්. එම්. එච්. සමරසිංහ

සමාජීය විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

menakaharsh@gmail.com

**ප්‍රමුඛ පදඃ** මඩුවන්වෙල වලව්ව, රටේ මහත්තයා, කාමරය, අදියර

## හැඳින්වීම

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරලයේ පිහිටි සුවිශාල මන්දිරයක් වූ මඩුවන්වෙල වලව්ව ඉදිකිරීමට පසුබිම් වූ ආකාරය, පරම්පරා හතරක් විසින් ඉදිකළ ආකාරය, හා වත්මන් තත්ත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙහි දී සිදු කර තිබේ.

## ක්‍රමවේදය

මේ සඳහා ද්විතියික මූලාශ්‍රය මගින් තොරතුරු ලබාගත් අතර ඒ යටතේ මූලාශ්‍ර පරිශීලනය, අන්තර්ජාලය මගින් හා මඩුවන්වෙල ක්ෂේත්‍ර අධ්‍යයනයක් මගින් තොරතුරු රැස් කර යථෝක්ත පර්යේෂණය සිදු කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡා

තම තමන්ද කීර්තිමත් වෙමින් කොලොන්නා කෝරලයට ද කීර්තිය ගෙන දුන් ප්‍රභූන් කිහිප දෙනෙකුටත් අනතුරුව තමන් සමග තම මව් බිමද කීර්තිමත් වන සේ ක්‍රියා කළ ජන නායකයකුටත් සෙවන සැලසූ මඩුවන්වෙල වලව්ව සියවස් තුනක කාලය ඉක්මවා ඇති ඓතිහාසික ස්ථානයකි.මුඛ පරම්පරාගත තොරතුරුවලට අනුව මඩුවන්වෙල වලව්ව මුලින් පැවති තිබෙන්නේ මඩුවන්වෙල මුදලින්දාරාමයට දකුණින් පිහිටි දූනට තල්ගහ කොරටුව නමින් හඳින්වෙන භූමි භාගයේය. එකල පැවති ගුහා නිර්මාණ ශිල්පය අනුව නිවාස ඉදි කරන ලද්දේ වරිච්චි බැඳ මැටි ගැසීමෙනි. ක්‍රිඃවඃ 1700දී මහනුවර රජ දැක්මට ඇලිගෝණෙකු ඉදිරිපත් කල විජය සුන්දර ඒකනායක අභයකෝන් මුදලිවරයා එය ක්‍රියාවට ඉදිරිපත් වන්නට ඇත්තේ මේ පැරණි නිවසේ ජීවත් වූ කාලයේය. ඇලිගෝණෙකු අල්ලා ගැනීමටත් ඒ සතා පණපිටින්ම මහනුවරට දක්කා ගෙන යෑමටත් හැකි වීමෙන් පෙනී යන්නේ ඔහුට වන සතුන් සම්බන්ධයෙන් සැලකිය යුතු දැනුමක් තිබුණ බවය. ඇලි ගෝණකු වැනි ඉතා දුර්ලභ ගණයේ සතෙකු වනයේ හැසිරෙන බව මෙන්ම හැසිරෙන ඉසව්වද එවැනි දැනුමක් නොමැති අයෙකුට දැන ගැනීමේ හැකියාවක් නොලැබෙන බව පිළිගත යුතු හෙයිනි.

දූනට මඩුවන්වෙල වලව්ව පවතින භූමිය පදිංචිය සඳහා තෝරා ගැනීමට තීරණය කර තිබෙන්නේ ද මෙසේ වනයේ හැසිරෙමින් සිටියදී දකින්නට ලැබුණු සිද්ධියක් නිසා බව ජන වහරේ එන ප්‍රකට වෘතාන්තයක් වෙයි. දිනක් සුපුරුදු පරිදි වනයට වැදි සතා පැමිණි දෙසට දෙනෙත් දල්වා විපරමින් බලා සිටියේය. ඒ අවස්ථාවේ හාවෙකු පසු ලුහු බඳින නරියෙක් ද පණ බියෙන් දුවන හාවා ද ඔහුගේ නෙතට ලක් වූහ. ගත වූයේ

මොහොතකි. මේ සතුන් දෙදෙනාගේම ඉරියව් වෙනස් විය. එනම් හාවා ආපසු හැරී නරියා පසුපස ලුහු බැඳීමත් නරියා හාවාගෙන් තම දිවි රැකුම සඳහා දිවීමත්ය. හාවා නරියාට පැරදුණු මේ බිම ජය භූමියක් ලෙස මුදලිතුමා නිගමනය කළේය. කෝට්ටේ රාජධානිය ඉදි කිරීමට මෙවන් පසු බිමක් හේතු වූ බව සමහර විට විජයසුන්දර මුදලි තුමා අසා තිබුණා විය හැකිය. එසේ නැතහොත් බලවත් සතුරෙකු දුබලයා අතින් පරාජයට පත්වන භූමිභාගය ජයබිමක් බවට පවතින ජ්‍යොතිශ්‍ය මතය දන සිටින්නට ද ඇත. කෙසේ වුවද අලකේශ්වරයන් නයාට මුගටියා පැරදුණු තැන කේන්ද්‍රකොට කෝට්ටේ බලකොටුව ඉදි කිරිමට තීරණය කලා සේ නරියා හාවාට පැරදුණු තැන මධ්‍යකරගෙන මඩුවන්වෙල වලව්ව ඉදිකරන්නට ඇති බව මෙවැනි ජනප්‍රවාද අනුව උපකල්පනය කළ හැකි ය.

අතීතයේ මේ බිම්කඩ හඳුන්වා ඇත්තේ කුරුනැග්ගොඩ යනුවෙනි. විජයසුන්දර මුදලිවරයාගේ සිත්ගත් මේ බිම්කඩ පිහිටා තිබෙන්නේ බටහිර කඳුකරයත් දකුණට හා නැගෙනහිරට විහිදෙන තැනිතලා ඉසව්වේය. එසේ හෙයින් සමසීතෝෂ්ණ දේශගුණයෙන් යුත් මෙවන් භූමියක් ක්ෂේම භූමියක් ලෙස සැලකීම අරුමයක් නොවේ.

මඩුවන්වෙල වලව්ව වූ කලි එක් පරම්පරාවකදී ගොඩනගා නිම කළ ස්ථානයක් නොවේ. පරම්පරා හතරකටවත් අයත් පුද්ගලයන් විසින් ඉදිකරවන ලද ගොඩනැගිලි සංකීර්ණයකි. මෙහි දෙ වැනි අදියරට අයත් ගොඩනැගිලි ඉදි කෙරෙන්නට ඇත්තේ මඩුවන්වෙල මොහොට්ටාල මෙහි ප්‍රභූත්වය දැරූ කාලයේදී යැයි උපකල්පනය කළහැකිය. ක්‍රි:ව: 1725 දී පනාමුරේ නින්දගම ලැබූ තැනැත්තා ඔහුය. මඩුවන්වෙල විජයසුන්දර ඒකනායක අභයකෝන් මුදලි නමින්ම දක්වෙන දෙවැන්නාගේ කාලයේ මෙහි තුන්වැනි අදියරට අයත් ගොඩනැගිලි ඉදිකෙරෙන්නට ඇතැයි සිතිය හැකිය. ක්‍රි:ව: 1761 දී වලකඩ නින්දගම් ලැබුණේ මේ මුදලිවරයාටයි. මොහුගේ කාලයේල දී මඩුවන්වෙල වලව්වට අයත් නින්දගම් සංඛ්‍යාව මෙසේ වැඩිවීම යනු ආදායම වැඩි වීමකි. එබැවින් වඩා දකුම්කළු වුද දිගු පුළුලින් යුක්තවූද ගොඩනැගිල්ලක් ඉදිකිරිමට ඔහුට හැකියාව තිබුණු බව පිළිගැනිමට අපහසු නැත. මහා බංගලාව හෙවත් අටපට්ටම් බංගලාවද තෙවැනි අදියරට අයත් කොටසකි. එහෙත් මඩුවන්වෙල රටේ මහාතාගේ කාලයේ මෙහි යම් යම් වෙනස්කම් කර ඇතිබව පැහැදිළි ය. මෙම ගොඩනැගිල්ලේ කොටසක් වශයෙන් එහි උතුරු පැත්තේ දක්නට ලැබෙන අළුත් විහාරය 1924 මැයි 18 වනදා නිම කරන ලද්දකි. මෙය රටේ මහතාගේ කාලයේ දී නිම කර ඇති බව පැහැදිළි ය. මෙය අළුත් විහාරය යනුවෙන් නම් කර තිබීමෙන් පැහැදිළි වන තවත් කරුණක් නම් මීට අමතරව තව විහාරයක් කලින් සිට පැවති බවයි. මහා බංගලාවේ දොරටුව ඉදිරිපිට සඳකඩ පහණද පසු කාලයේ නිමවන ලද්දකි. 1878. 2. 26. යන්න එය මතු පිට කොටා තිබේ. මේ අනුව එයද රටේ මහාතාගේ කාලයට අයත් බව පැහැදිළිය.

මේ ගොඩනැගිලි සංකීර්ණයේ සිව්වැනි අදියරට අයත් ගොඩනැගිලි වශයෙන් පෙනී යන්නේ බටහිර කෙලවරේ දෙමහල් මන්දිරය හා නැගෙනහිර දෙසින් ඉදිකර තිබෙන අධිකරණ ශාලාවයි. දෙමහල් ගොඩනැගිල්ලේ දොර, ජනෙල්, උළුවහු, බාල්ක, යටලී, පරාල හා පඩි පෙළ ඇතුළු දැවයෙන් නිම කර ඇති සියළු කොටස් සඳහා යොදා ගෙන තිබෙන්නේ බුරුත දැව වීම මෙහි විශේෂත්වයකි. මේ ගොඩනැගිල්ල බුරුත මාලිගාව යනුවෙන් හැඳින්වෙන්නේ ද මේ හේතුවෙනි. පළමුවැනි දෙවැනි හා තුන්වැනි අදියරවලට අයත් ගොඩනැගිලි සියල්ලේම බිත්ති වරිච්චි බැඳ මැටි ගසා ඉදිකර ඇති නමුත් මේ ගොඩනැගිල්ලේ බිත්ති ගලින්

බැඳ ඉදිකර තිබීම විශේෂත්වයකි. මෙහි බිම් මහල සිසිල්ව තබා ගැනීම සඳහා බිත්තිවල මුදුනත්, සෝල්දරයත් අතර මිනිරන් පුරවා තිබේ. දකුණු පස ආලින්දය පිරිත්මණ්ඩපය වශයෙන් ප්‍රයෝජනයට ගත හැකිවන සේ අලංකාර ලෙස නිම කරන ලද්දකි. එහි දොරවල් කැටයමින්ද බිම් රටා මැවෙන සේ ඇතුල පිඟන් ගඩොලින්ද විසිතුරු ලෙස නිම කර තිබේ. 1905 ජනවාරි 01දා එහි සිත්කම් කර තිබෙන හෙයින් ඒ මණ්ඩපයේ වැඩ නිම කළ දිනය සේ එම දිනය පිළිගත හැකිය. එහි ඉහළ මාලය ඉදිකර තිබෙන්නේ එහි සිට හැම පැත්තක්ම දකගත හැකි වන ලෙසිනි. මේ ගොඩනැගිල්ල ඉදි කිරීමේ අරමුණ වලව්වට පැමිණි අමුත්තන්ගේ නවාතැන් පහසුව සැලසීම එනම් ආගන්තුක සත්කාරයේ එක් අංගයක් සපුරාලීම බව උපකල්පනය කළහැකිය. ගොඩනැගිල්ල පිවිසුම් දොරටු හතරකින් සමන්විතය.

මෙහි ඉහළ මාලයට නැගීම සඳහා ඉදිකර ඇති ඉනිමඟ පා මුල හිරු ලකුණ පිඟන් ගඩොලින් සිත්කම් කර තිබේ. දිවා කාලයේ කවර අවස්ථාවක වුවද ඉහළ මාලයට සූර්යාලෝකය පතිත වනු බව සංකේත කරනු වස් මේ සිත්තම නිර්මාණය කළහයි උපකල්පනය කළ හැකිය. අඩි 31 ×16 ආලින්ද දෙකකින්ද සමන්විත මෙහි සෝල්දරය සඳහා අතුරන ලද ලෑලි කොතරම් සැලකිල්ලෙන් හේත්තුවද්දා තිබේද යත් සෝල්දරය මත වතුර වක්කර ලෑලි අතරින් කාන්දු වන්නේදැයි පරීක්‍ෂා කරමින් එය නිම කළ බව ක්ෂේත්‍ර අධ්‍යයනයේදී දක්නට ලැබුණි. ඉහළ මාලයේ ශාලාව අමුත්තන්ට විවේක ගැනීම සඳහා ඉදිකර ඇති බවද උපකල්පනය කළ හැකිය.

වහල සෙවිලි කිරීම සඳහා සිංහල උළු සහ පෙති උළු යන දෙවර්ගයම කොලොන්න කෝරළයේ දී නිෂ්පාදනය කරන්නට ඇති සේ පිළිගැනීම සාධාරණය. අතීතයේ එනම් මේ ගොඩනැගිලි ඉදි කළ කාලයේ පැවති ඌන ප්‍රවාහන පහසුකම් අනුව ඊට වෙනස් ආකාරයකින් නොසිතිය හැකිය. වලව්ව තුළ සිට මහා බංගලාවට පිවිසීම සඳහා ඉදි කර තිබෙන උළු වස්සේ සනකම අගල් 14ක් වන අතර උස අඩි 6යි අගල් 10ක් පළල තනි ලෑල්ලේ දොරක් ඊට සවිකර තිබේ. ලෑල්ලේ සනකම අගල් දෙකකි. මහල් දෙකට සිටින සේ උළුවස්ස නිම කර තිබේ. උඩෙලිපතට ඉහලින් ලෑලි දොරක් සහිතව නිම කරන ලද කුටිය තුළ සීවලි ධාතු කරඬුව තැන්පත් කරන ලද බව උපකල්පනය කළ හැකිය. සීවලි විහාරය ලෙස යනුවෙන් හඳුන්වා ඇත්තේ ඒ දොරටුව සහිත කාමරයයි. රටේ මහතා නිදන කුටිය තුළ සිට මහ බංගලාවට පිවිසීමේ දී සීවලි ධාතු කරඬුව තැන්පත් කළ කුටිය සහිත උළුවස්ස යටින් ගමන් කළ යුතුය. මේ ගොඩනැගිලි සංකීර්ණයට රටේ මහාතාගේ කාලයේ එක් වූ තව ගොඩනැගිල්ලක් නම් අධිකරණ ශාලාව හෙවත් නඩු ශාලාවයි. අඩි 41. 10 × 27.10 ක් දිගු පුළුලැති ශාලාවකින් හා කාමර දෙකකින් මේ ගොඩනැගිල්ල සමන්විත වෙයි. කාමර දෙකින් එකක් අධිකරණ කටයුතු සම්බන්ධයෙන් රටේ මහාතාගේ කාර්යාල වශයෙන් යොදා ගත් බව පෙනී යන අතර අනෙක් කාමරය ලිපිකරුවන් සඳහා වෙන් වූ බව උපකල්පනය කළ හැකිය. සිංහල උළු සෙවිලි කර ඇති මේ ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ගත් විට වර්ග අඩි 1705න් සමන්විතය.

ගොඩනැගිලි සංකීර්ණයේ මුල් පියවරට අයත් ගොඩනැගිල්ලේ කොටසක්ද වී ගබඩාවල් වඩු මඩු කම්මල් ආදි ගොඩනැගිලි ද අශ්ව ස්ථාල ආදිය ද සම්පූර්ණයෙන්ම විනාශ වී ගොස්ය. වර්ග අඩි 19980ක ප්‍රමාණයේ ගොඩනැගිලි දනට ඉතිරිව ඇති අතර හානියට පත් කොටසත් සමග වර්ග අඩි 35000 කට නොඅඩු ප්‍රමාණයක ගොඩනැගිලි තිබෙන්නට ඇතැයි පෙන්වාදිය හැකිය. මේ ගොඩනැගිලි සංකීර්ණයට

අන්තර්ගතව මැද මිදුල් 21ක් 11ක් බව පැවති ජනප්‍රවාදයේ එයි. එසේ වුවද දැනට ඉතිරිව ඇත්තේ මැද මිදුල් 7ක් පමණි. දැනට ඉතිරිව තිබෙන දොරටු සංඛ්‍යාව 83කි. හානියට පත් වූ කොටසේ ද එපමණක් දොරටු තිබෙන්නට ඇතැයි විශ්වාස කෙරේ. සෑම මැද මිදුලක් වටාම සිවුරැස් ආලින්දයක් ඉදිකර තිබුණු අතර ඉන් සමහරක බිම පිඟන් ගඩොළු අල්ලා අලංකාර කර තිබේ. සිව් පැත්තෙන්ම කාමරවල දොරටු මැද මිදුලට විවෘතය. මැද මිදුල්වලට වැටෙන වැසි ජලය ප්‍රධාන කානුවලට ගලායන පරිදි ගොඩනැගිලි සංකීර්ණය යටින් සකස් කළ කානු පද්ධතියකි.

වලව්වේ දැනට ඉතිරි කාමර කිහිපයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නම් කර තිබේ. ඒවා ලෙස නිදන කාමරය, රදළ ඇත්තන්ගේ නිදන කාමරය, කැවිලි ගබඩා කාමරය, පුංචි කුමාරිහාමිගේ ගබඩාව, රටබීම ගබඩාව, රදළ ඇත්තන්ගේ කෑම පිළියෙල කරන කාමරය, බුලත් ගබඩාව, සීවලි විහාරය, බුදුගෙය, තිඹිරිගෙය යනාදිය පෙන්වා දිය හැකිය.ඉහත සඳහන් කළ කරුණු අනුව මඩුවන්වෙල වලව්ව ඉදිකිරීමට පසුබිම් වූ කරුණු, අදියර හතරක් යටතේ ඉදිකළ ආකාරය, හා එහි වත්මන් තත්ත්වය ආදිය මනාව පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

විජිතනන්ද, කැලිගම. (2003)***කොලොන්නා කෝරළයේ ඉතිහාසය මඩුවන්වෙල වලව්ව සහ ලංකාවේ කළු කුමාරයා.*** කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.